## කොටස් වෙළෙඳපොළ විශාල ලෙස ඉහළයාමේදී ආයෝජකයින් සැළකිලිමත් විය යුතු කරුණු

- කාර්යසාධනය අතින් ඉහළ (Fundamentally Strong) සමාගම්වල කොටස් මිල ගණන් ඉහළ නැගීමත් සමඟ ආරම්භ වන කොටස් වෙළෙඳපොළේ ඉහළ යාම, පසුව කාර්යසාධනය අතින් ඉහළ බවක් නොමැති සමාගම්වල කොටස් මිල ගණන් වලටද බලපෑමක් ඇති කරයි. එසේ ඉහළ නගින කාර්යසාධනය අතින් අඩු සමාගම්වල කොටස් මිල ගණන් ඉහළයාමට හේතු සොයා බලා ආයෝජකයින් එම සමාගම්වල ඥානාන්විතව ආයෝජනය කළ යුතුය.

- කොටස් වෙළෙඳපොළේ ඉහළයාමත් සමඟම ආයෝජකයින් සමහර විට දිගුකාලීන අරමුණු ඉවතලා කෙටිකාලීන අරමුණු මත ගණුදෙනු කිරීමට පෙළඹේ. එය ණුවනැති ක්‍රියාවක් නොවේ.

- කොටස් වෙළෙඳපොළේ ඉහළ නැගීමත් සමඟම ආයෝජකයින්, තමන් විවිධ ආයෝජන මාර්ගවල ආයෝජනය කර ඇති මුදල් ඒවායින් ඉවත් කර ගෙන සම්පූර්ණයෙන්ම කොටස් වෙළෙඳපොළේ ආයෝජනය කිරීමට පෙළඹේ. ආයෝජන විවිධාංගීකරණය ආයෝජකයෙකුට අත්‍යවශ්‍ය දෙයකි. එයින් හැඟවෙනුයේ එකම ආයෝජන මාර්ගයක තම මුදල් ආයෝජනය නොකළ යුතු බවයි.

- කොටස් වෙළෙඳපොළේ ඉහළයාමත් සමඟ සමහර ආයෝජකයින් තමන්ට දරා ගැනීමට අපහසු ආකාරයට ණය ලබාගෙන කොටස් වෙළෙඳපොළේ ආයෝජනය කිරීමට පෙළඹේ. එහෙත් ආයෝජකයකු ණය ලබාගෙන කොටස් වල ආයෝජනය කළ යුතු වන්නේ තමන්ට දරා ගත හැකි ආකාරයටය.

- කොටස් වෙළෙඳපොළේ ඉහළයාමත් සමඟම දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් වන්නේ විවිධ පුද්ගලයින් සමාජ මාධ්‍ය හරහා ආයෝජන උපදෙස් දීමට උත්සාහ කිරීමයි. FB, Twitter (X), WhatsApp, Telegram වැනි සමාජ මාධ්‍ය හරහා කොටස් වෙළෙඳපොළ පිළිබඳව විවිධ තොරතුරු හුවමාරු වේ. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව (SEC) වෙතින් RIA (ලියාපදිංචි ආයෝජන උපදේශක) සුදුසුකම ලබාගෙන නොමැති කිසිවෙකුට විවිධ මාධ්‍ය හරහා ආයෝජන උපදෙස්, පුරෝකථන (කොටස් මිල ගණන් හෝ කොටස් වෙළෙඳපොළේ ඉහළයාම පිළිබඳව) ලබා දිය නොහැක. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මෙම සමාජ මාධ්‍ය නිතිපතා නිරීක්ෂණය කරනු ලබන අතර එවැනි වැරදි කරන්නන් හට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලබයි.

- කොටස් වෙළෙඳපොළේ ඉහළයාමත් සමඟම සමහර ආයෝජකයින් වැඩි ලාභ ලබා ගැනීමේ අරමුණින් විවිධ අක්‍රමිකතා කොටස් වෙළෙඳපොළ ගණුදෙනු හරහා සිදු කිරීමට උත්සාහ කරනු ලබයි. මෙසේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත උල්ලංඝනය කරන ඕනෑම අයෙකුට විරුද්ධව ක්‍රියාමාර්ග ගැනීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කටයුතු කරයි. එමෙන්ම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව දිනපතා සජීවීව කොටස් වෙළෙඳපොළේ ගණුදෙනු නිරීක්ෂණය කරනු ලබයි.

- තමන් හදිසියකට පාවිච්චි කිරීම සඳහා ළඟ තබා ගෙන ඇති මුදල් කිසිම ආයෝජන මාර්ගයක ආයෝජනය කිරීම ආයෝජකයකු සිදු නොකළ යුතු ක්‍රියාවකි.

- එමෙන්ම මහා පරිමාණ ආයෝජකයින් අනුකරණය නොකර තම ආයෝජන අරමුණු මත පිහිටා ආයෝජනය කළ යුතුය.

- ආයෝජකයින් කොටස් තැරව්කාර ආයතන විසින් ප්‍රසිද්ධ කරනු ලබන සමීක්ෂණ වාර්තා පරිහරණය කර හෝ තමන් විසින් සිදුකරන සමීක්ෂණ මත පිහිටා තම ආයෝජන තීරණ ගත යුතුය.

- ලියාපදිංචි ආයෝජන උපදේශකවරුන් (RIA) සෑම විටම ගණුදෙනු සිදුකළ යුත්තේ තම ආයෝජකයා විසින් ලබාදෙන මිලදීගැනීමේ/ විකිණීමේ ඇණවුම් මතය. එසේ නොමැතිව ආයෝජකයාට නොදන්වා කොටස් මිලදී ගැනීමට/ විකිණීමට ලියාපදිංචි ආයෝජන උපදේශකවරයෙකුට අයිතියක් නොමැත. (අභිමතය පරිදි ගණුදෙනු කිරීමේ ගිණුමක් -Discretionary Account නොමැති නම් )

- සමහර ආයෝජකයින් තමන්ට ලාභ ලැබෙන විට තම ආයෝජන උපදේශකවරයා විසින් එම ගණුදෙනු තමන්ට නොදන්වා සිදුකර තිබුණත්, ඒ පිළිබඳව පැමිණිලි නොකර සිටින අතර යම් ආකාරයකින් කොටස් මිල පහළ වැටුණු විට පැමිණිළි කරයි. ආයෝජකයකු විසින් සිදුකරන ලද ගණුදෙනු පිළිබඳව කෙටි පනිවුඩයක් (SMS) හරහා එදිනම කොටස් තැරැව්කාර ආයතනය විසින් ආයෝජකයා දැනුවත් කිරීමක් සිදු කෙරෙන අතර කොටස් මිලදී ගැනීම්/විකිණීම් වලට අදාළ ගැණුම් සටහන්/විකුණුම් සටහන් (Bought Note/Sold Note) ඊ-මේල් මගින් ලැබීමට සැළැස්වීම හරහා ආයෝජකයා දැනුවත් කෙරෙන බැවින් සිදුකළ ගණුදෙනු පිළිබඳව ආයෝජකයා නොදැන සිටීමට හේතුවක් නොමැත.

- ලෝකයේ කිසිම කොටස් වෙළෙඳපොළක් නොකඩවා ඉහළ යන්නේ හෝ නොකඩවා පහළ යන්නේ නැත. උච්චාවචන කොටස් වෙළෙඳපොළකට පොදු දෙයකි. කොටස් මිල ගණන් සැළකිය යුතු ලෙස පහළ වැටුණු විට ආයෝජකයින් කොටස් මිලදී ගැනීමට පෙළඹෙන අතර කොටස් මිල ගණන් සැළකිය යුතු ලෙස ඉහළ නැගුනු විට සමහර ආයෝජකයින් තමන් සතු කොටස් විකුණා ලාභ ලබා ගනී. කොටස් වෙළෙඳපොළක් දිගුකාලීන ආයෝජන මාර්ගයක් ලෙස සලකන්නේ එබැවිනි.

- නැණවත්ව ආයෝජනය කරන්න.
  කොටස් වෙළෙඳපොළ ඉතා ඉහළ ප්‍රතිලාභ ගෙන දෙන ආයෝජන මාර්ගයක් වන අතර සෑම ආයෝජන මාර්ගයකටම පොදු අවදානමක් කොටස් වෙළෙඳපොළේ ද ඇත. අවදානම අවම කර ගැනීමට ආයෝජන විවිධාංගීකරණය, දැනුවත්ව ආයෝජනය කිරීම, තමන් කොටස් මිලදී ගන්නා සමාගම් පිළිබඳව අධ්‍යයනය කිරීම, අනවශ්‍ය ලෙස ණය වී කොටස් මිලදී නොගැනීම වැනි දේ පිළිපදින්න.